

# ශ්‍රී ලංකාවේ වැල්දොඩම් ආකාර

**පැ**ෂන් ෆෲට් පවුල හෙවත් Passifloraceae කුලයට අයත් සියලුම විශේෂයන් පාහේ ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් විශේෂයන්ය. වැල්දොඩම්, ඩේසි පුහුල් හා නුවරඑලිය පැණි ෆැෂන්ෆෲට් ආදී වගා කරන ආකාරයන් ද වල් පැෂන් හා දැල් බටු ආදී වල් පැළෑටි ලෙස වැඩෙන ආකාරද සමහරක් අලංකාරය පිණිස වවන ආකාරයන්ද මෙම කුලයට අයත්ය. පැෂන් ෆෲට් විශේෂ දහයක් පමණ ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන අතර සමහරක් ස්වභාවීකරණයට ලක්වෙමින් පවතී. නයිහොඬ හා දැල්බටු මෙලෙස ස්වාභාවිකරණයට ලක්වූ වැල්දොඩම් ආකාරයන්ය. මෙම ලිපියෙන් අපේක්ෂා කරන්නේ පලතුරු ලෙසට යොදා ගන්නා ආකාර පිළිබඳ ඔබ දැනුවත් කිරීමයි.

## සාමාන්‍ය වැල් දොඩම් (Passion fruit)

තෙත් හා වියළි යන කලාප දෙකෙහිම වැඩෙන *Passiflora edulis* සුලභතම වැල් දොඩම් ආකාරයයි. කලාතුරකින් තෙත් කලාපයේ සමහර තැනක ස්වභාවීකරණයට ලක්ව තිබිය හැකිය. ඵල ඉදුණු පසු කහ පාට, දම් පාට හා අතරමැදි රෝස පැහැයක් ගන්නා ලෙසට ආකාර කිහිපයක් ඇත.





දම් පැහැති ආකාරය නුවරඑළිය වැනි ප්‍රදේශ වල දැකිය හැකි අතර අනෙක් ආකාර බොහොමයක් ප්‍රදේශවල ව්‍යාප්තව ඇත. නැවුම් පලතුරක් ලෙස මෙන්ම පානයන් හා කෝඩියල් සෑදීමට ද යොදා ගනී. කොල, මැල්ලුම් ලෙස ද භාවිතයට ගැනේ.

## පැණි පැෂන් (Sweet passion fruit)



පැණි පැෂන් *Passiflora ligularis* විශේෂය නුවරඑළිය වැනි කඳුකර ප්‍රදේශවල දැකිය හැක. මෙහි පත්‍ර හෘදාකාර-අණ්ඩාකාරය. පත්‍ර ඛණ්ඩිකාවලට නොබෙදෙන නිසා අනෙක් පැෂන් ආකාරවලට වඩා වෙනස්ය. මලේ රේණු නිල් පැහැතිය. ඵලය සාමාන්‍ය වැල්දොඩම් ප්‍රමාණයේම වටකුරු එකකි. ඉදීමට පෙර කොල පැහැයක් ගන්නා අතර සුදු පැහැති තිත් දැකිය හැකිය. ඉදුණු පසු තැඹිලි හෝ රතු-දම් වර්ණයක් ගනී. පැණි රසින් යුක්ත හා ඇඹුල් රසක් නැති නිසා බොහෝ දෙනෙක් ප්‍රිය කරයි.

## ඩේසි පුහුල් (Granadilla)



*Passiflora quadrangularis* ශාකය ටන් ටින් නැතහොත් යෝධ පැෂන් ලෙස ද සමහරු හඳුන්වයි. පත්‍ර අණ්ඩාකාර හැඩයක් ගන්නා අතර විශාල එකකි. මල අනෙක් ආකාරවලට වඩා විශාල දුඹුරු-දම් පැහැයට හුරු එකකි. පැෂන් ආකාර අතුරින් විශාලතම ඵල දරන විශේෂය මෙයයි. ඵලය කුඩා පුහුල් ගෙඩියක් වැනි නිසා මෙයට ඩේසි පුහුල් යන නම යෙදී ඇත. ව්‍යාප්තිය බීජ හා අතු බැඳීම මගින් සිදුකළ හැක. මෙම ඵලයන් ළපටි කාලයේ එළවළුවක් ලෙසත් ඉදුණු පසු පලතුරක් ලෙසත් යොදා ගත හැකිය. පැෂන් වල මෙන් ඵලයේ මැද බීජ පිහිටයි. මෙහි බීජ පමණක් නොව පිටත පොත්ත රැහැදමා ලෙල්ල කොටසේ මාංශලය ද ආහාරයට ගතහැකිය. මෙය ජෑම් ආදියේ පිරවුම් කාරකයක් ලෙසත් බීම සෑදීමටත් යොදා ගත හැකිය.

## ගිලන්ඩේරි (Banana passion fruit)

**01. Banana passion fruit (*Passiflora mollissima*)** පැෂන් ඍටි මෙන් දිගුව වැඩෙන වැල ගස් මුදුන් දක්වා ගමන් කරයි. පත්‍රය ඛණ්ඩිකා තුනකට බෙදී ඇත. මල රෝස පැහැති අලංකාරමත් එකකි.



මෙහි ඵලය රවුම් හැඩයක් නොගෙන දිගැටි හැඩයක් ගන්නා නිසා කෙසෙල් වැල්දොඩම් ලෙස හඳුන්වයි. ගෙඩියක් සෙන්ටිමීටර් 7-12 විතර දිගු විය හැකිය. ඉදුණු ගෙඩිවල ලෙල්ල කහ පැහැතිය. ඇතුළත වැල් දොඩම් ආකාරයේ බීජ වලින් පිරී පවතී. ව්‍යාප්තිය බීජ මඟින් සිදු වේ. පලතුරක් ලෙස වැල්දොඩම්වල මෙන් බීජ වටා යුෂයෙන් පිරුණු මාංසලය ආහාරයට ගත හැකිය.

**02. Red banana passion fruit (*Passifora antioquiensis*)** නිවර්තන ඇමරිකාවෙන් හඳුන්වා දී ඇත. වැල දිගුව වැඩෙන අතර ගස් මුදුන් දක්වා ගමන් කරයි.




පත්‍ර බණ්ඩිකා තුනකට බෙදී ඇත. මල් තද රෝස පැහැයේ සිට රතු පැහැය දක්වා විවිධ වේ. දිගැටි දෙකෙලවර සිහින් වූ සිලින්ඩරාකාර හැඩයක් ගන්නා ඵලයක් දිගින් සෙන්ටිමීටර් 12 ක් දක්වා දික්විය හැකිය. ව්‍යාප්තිය බීජ මඟින් සිදු වේ. මෙහි ඵලද පලතුරක් ලෙසට ආහාරයට ගත හැකිය.

## **නයිහොඬ** (White passion flower)

*Passiflora subpeltata* යන ආකාරය නුවරඑලිය වැනි කඳුකර ප්‍රදේශවල දැකිය හැකි තැන තැන වැවෙන, ස්වභාවීකරණයට ලක්වූ වැල්දොඩම් ආකාරයකි.




පත්‍ර අසම්පූරණ ලෙස බණ්ඩිකා තුනකට බෙදී ඇති අතර එම බණ්ඩිකා අග මොට ගතියක් ඇත. මල පැෂන් මලකට හැඩයෙන් සමානය. නමුත් වර්ණයෙන් සුදු පැහැති වන අතර ප්‍රමාණයෙන් කුඩාය. ඵලය වටකුරුය. පැෂන් ගෙඩියකට වඩා මදක් කුඩා, කොල පැහැති එකකි. ඉදුණු විට ලා කහ පැහැයක් දරයි. ඵලයෙහි ලෙල්ල තුනී නිසා ඵලය බරින් අඩුය. ඵලය තුළ වැල්දොඩම්වල මෙන් බීජ ඇති අතර වන පලතුරක් ලෙස ඒවා ආහාරයට ගත හැකිය. ඇඹුල් රසින් හා යුෂමය ගතියෙන් අඩුය.

## **දේවදාලිය** (Love-in-mist)

දැල්බටු *Passiflora foetida* යන විද්‍යාත්මක නාමයෙන් හැඳින්වෙන මෙය වැල් දොඩම්වල වනදර්ශයකි. හොඳින් හිරුඑළිය වැටෙන අතහැර දැමූ පිට්ටනි, පාළු වතුපිටි, පාරවල් දෙපස හා වැටවල් අයින් වලත් වැව් බැමි ආදී ස්ථාන වලත් සුලභව දැකිය හැකිය.




වැල හා පත්‍ර මෙන්ම අනෙකුත් බොහොමයක් කොටස් රෝම වලින් ඝනව ආවරණය වී ඇත. ශාකයේ සියලුම කොටස් වලට ආවේණික ගන්ධයක් අඩංගුය. පත්‍ර, වැලට සවිවන ස්ථානයෙන් පහුරු ඇති වේ. මලෙහි අඩංගු මණිපත්‍ර තුන ගෙඩිය ඉදී අවසන් වන තෙක්ම ඵලය ආරක්ෂා කරයි. දැල් ආකාර මණිපත්‍රය ඇති නිසා දැල්බටු ලෙස ද මණිපත්‍රයේ හා ඵලයේ පිට පැත්ත තෙල් ගතියකින් යුක්ත නිසා තෙල්බටු ලෙස ද හඳුන්වයි. ඵලය තුළ පැෂන් ඇට මෙන් මාංසලයකින් වට වූ කළු පැහැති බීජ රාශියක් අඩංගුය. මාංසලයෙන් වට වූ බීජ වන පලතුරක් ලෙස ආහාරයට ගත හැකි අතර ඇඹුල් මිශ්‍ර පැණි රසකින් හා ආවේණික රසයකින් යුක්තය. ව්‍යාප්තිය සිදුවන්නේ බීජ මඟිනි. පලතුරට අමතරව දැල් බටු, ළපටි පත්‍ර හා දළු මිශ්‍ර පලා ඇඹුලට හා පලා මැල්ලුම් සඳහා යොදා ගත හැකිය.

තොරතුරු ගෙන එන්නේ,
**අරුණ යසපාලිත**
විෂයභාර නිළධාරී (උද්‍යාන බෝග)
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය,
පොළොන්නරුව